දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

| | |
|---|---|
| අමාත්‍යතුමා / அமைச்சர் / Minister | 2784832<br>2784807<br>2785617 |
| ලේකම් / செயலாளர் / Secretary | 2784812 |
| කාර්යාලය / அலுவலகம் / Office | 2785141-50<br>Fax: 2784846 |

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. ..........................................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.
"இசுருபாய"
பத்தரமுல்ல.
"Isurupaya"
Battaramulla.

මගේ අංකය / எமது இல. / My No. ED/1/6/5/1/SBLIG-NS-4 (2018)

දිනය / திகதி / Date 2018.06.25

**චක්‍රලේඛ අංක: 27/2018**

**සියලු ම ජාතික පාසල් විදුහල්පතිවරුන් වෙත.**

**අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව හා වැඩසටහන (2015 - 2019)**
**අධ්‍යාපන අමාත්‍යාංශය**

**විෂයය: සියලු ම ජාතික පාසල්වල ගුණාත්මක සංවර්ධනය උදෙසා ලබාදෙන "පාසල් පාදක ඉගෙනුම් ප්‍රවර්ධන ප්‍රදානය" (School-Based Learning Improvement Grant - SBLIG) (2018)**

පාසල් සිසුන්ගේ ඉගෙනුම් සාධන මට්ටම් ඉහළ නැංවීමේ අරමුණින් පාසල් මට්ටමින් විවිධ ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර මෙම ව්‍යාපෘති හා වැඩසටහන් සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා ගැනීමේ දී පාසල්වලට මුහුණපෑමට සිදුවන දුෂ්කරතා මඟහැරවීමට සහායක් ලෙස මෙම වර්ෂයේ ද මූල්‍ය ප්‍රදානයක් ලබා දීමට අධ්‍යාපන අමාත්‍යාංශය තීරණය කොට ඇත. එමෙන්ම 2015.01.29 දිනැති අංක 05/2015 දරණ "පාසල්වල අවිධිමත් ලෙස මුදල් අයකිරීම තහනම් කිරීම" යන මැයින් යුත් චක්‍රලේඛය මඟින් ලබා දුන් උපදෙස් ක්‍රියාත්මක කිරීමේදී පාසල්වලට සහායක් වශයෙන්ද, අත්‍යවශ්‍ය වියදම් පියවා ගැනීමට සහායක් වශයෙන්ද මෙම ප්‍රදානය ක්‍රියාත්මක වේ. ඒ අනුව සියලු ම ජාතික පාසල් වලට, අවසන් ගෙවීමක් ලෙස (outright grant) මෙම විශේෂ ඉගෙනුම් ප්‍රවර්ධන ප්‍රදානය ලබා දීමට අධ්‍යාපන අමාත්‍යාංශය කටයුතු යොදා ඇත. එම ප්‍රදානය ක්‍රමවත්ව උපයෝජනය කිරීම සම්බන්ධ උපදෙස් මෙම චක්‍රලේඛය මගින් නිකුත් කෙරේ.

02. පාසල් නඟාසිටුවීමේ වැඩසටහන යටතේ පාසල් පාදකව ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් වඩාත් ශක්තිමත්ව ක්‍රියාත්මක කිරීම සඳහා, එනම්, පාසල් සිසුන්ගේ ඉගෙනුම් සාධන මට්ටම් ඉහළ නැංවීමට අදාළ විශේෂ ව්‍යාපෘති හා වැඩසටහන්, ගුරුවරුන්ගේ වෘත්තීය ධාරිතා සංවර්ධන වැඩසටහන්, විෂයානුබද්ධ වැඩසටහන්, විෂය සමගාමී හා විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා මෙම ප්‍රදානය යොදා ගත හැකිය. සමස්තයක් වශයෙන් පාසල් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම උදෙසා ශිෂ්‍ය ඉගෙනුම් සාධන මට්ටම් හා සිසුන් තුළ උසස් මට්ටමේ ඉගෙනුම් නිපුණතා (higher-order learning competencies) ප්‍රවර්ධනය කිරීමට මෙම ප්‍රදානය යොදාගැනීමට කටයුතු කළ යුතුය.

03. මෙම ප්‍රදානයේ සිව්වන පියවර ලෙස ඔබ ජාතික පාසලට රුපියල්.................................ක ප්‍රදානයක් අවසන් ගෙවීමක් ලෙස (outright grant) ලබාදෙන අතර එය ඔබ පාසලේ "පාසල් සංවර්ධන බැංකු ගිණුමට" අධ්‍යාපන අමාත්‍යාංශයේ ගිණුම් අංශය විසින් බැර කරනු ඇත. මෙම ප්‍රදානය ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක "අනාගත

ජාතික පාසල් ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල" සහ "අධ්‍යාපන අධ්‍යක්ෂ/ ප්‍රතිපත්ති හා සැලසුම් ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල" යන ලිපිනයට ද එවිය යුතුය.

07. මෙම ප්‍රදානය මඟින් ලැබෙන මුදල් ගිණුම්ගත කළ යුත්තේ **පාසල් සංවර්ධන ගිණුම** යටතේ ය. තව ද, එම විශේෂ ප්‍රදානය සම්බන්ධයෙන් වැය ලෙජර වෙනම පිටුවක නඩත්තු කළ යුතු අතර අදාළ ගිණුම් වාර්තා වෙනම පවත්වා ගත යුතුය. මෙම ප්‍රදානය යටතේ ලැබෙන මුදල් 2018 සැප්තැම්බර් 30 දින වන විට සම්පූර්ණයෙන්ම වැය කර අවසන් කළ යුතුය.

08. 2013.11.28 දාතම අංක 07/2013 චක්‍රලේඛය හා මාර්ගෝපදේශ අත්පොත සහ එහි 2014.02.18 දාතම සංශෝධිත උපදෙස් ලිපියේ ඇතුළත් විධිවිධාන අනුව සිව්මස් ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීමේ දී මෙම වැඩසටහනේ ප්‍රගතිය ද ඇතුළත් කළ යුතුය. ඒ සඳහා ඇමුණුම 02 [SBLIG – NS 4 - (2018)] ආකෘතිය භාවිතා කළ යුතුය. භෞතික හා මූල්‍ය ප්‍රගති වාර්තා "අධ්‍යාපන අධ්‍යක්ෂ/ ජාතික පාසල්, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල" සහ "අධ්‍යාපන අධ්‍යක්ෂ/ ප්‍රතිපත්ති හා සැලසුම් ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල" ලිපිනයට 2018.10.30 දිනයනට පෙර ඉදිරිපත් කළ යුතුය.

09. **නියාමනය, වාර්තාකරණය හා විගණනය**

මෙම ප්‍රදානය යොදා ගනිමින් කෙටිකාලීන එහෙත් ඵලදායී ව්‍යාපෘති/වැඩසටහන්/ක්‍රියාකාරකම් සැලසුම්කොට ක්‍රියාත්මක කිරීම හරහා පාසල්වල සිසුන්ගේ ඉගෙනුම් සාධන මට්ටම් ඉහළ නැංවීමට අවශ්‍ය පියවරයන් ගත යුතුය. මෙම ප්‍රදානය ඵලදායීව උපයෝජනය කරනු ලබන්නේ ද යන්න පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික පාසල් ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නියාමනය කරනු ලබන අතර, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් ද ඒ සම්බන්ධයෙන් නිරන්තරයෙන් අධීක්ෂණය කළ යුතුය. එසේම මෙම ප්‍රදානය උපයෝජනය කිරීම පිළිබඳ විගණනයට යටත් වේ.

10. මෙම චක්‍රලේඛය හා මාර්ගෝපදේශයන් ක්‍රියාත්මක කිරීමට අදාළව පැන නගින ඕනෑම ගැටළුවක් වෙතොත් ඒ සම්බන්ධයෙන් අර්ථ නිරූපනය හා අවසාන තීරණය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සතුවේ.

සත්‍ය පිටපති

M. R. M. Irshan

Deputy Director of Education

Ministry of Education

Isurupaya

Battaramulla

තිස්ස හේවාවිතාන

ලේකම් (වැ.බ.)

අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් :
1. ලේකම්, අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය
2. විගණකාධිපති
3. සියලු ම අතිරේක ලේකම්වරුන්, අධ්‍යාපන අමාත්‍යාංශය
4. සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
5. සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
6. ප්‍රධාන ගණකාධිකාරී, අධ්‍යාපන අමාත්‍යාංශය
7. ප්‍රධාන අභ්‍යන්තර විගණක, අධ්‍යාපන අමාත්‍යාංශය
8. අධ්‍යාපන අධ්‍යක්ෂ, ප්‍රතිපත්ති හා සැලසුම්, අධ්‍යාපන අමාත්‍යාංශය
9. අධ්‍යාපන අධ්‍යක්ෂ, ජාතික පාසල්, අධ්‍යාපන අමාත්‍යාංශය
10. සියලු ම අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව හා වැඩසටහන (2015-2019)

අධ්‍යාපන අමාත්‍යාංශය

**සියලු ම ජාතික පාසල්වල ගුණාත්මක සංවර්ධනය උදෙසා ලබා දෙන පාසල් පාදක ඉගෙනුම් ප්‍රවර්ධන ප්‍රදානය**
**(School-Based Learning Improvement Grant) (2018)**

**පාසල් මට්ටමින් භෞතික හා මූල්‍ය ප්‍රගතිය වාර්තා කිරීම**

පාසලේ නම : .......................................................

| පා.පා.ඉ.ප්‍ර.ප්‍ර. යටතේ ලද මුදල රුපියල් | ප්‍රදානය ලද දිනය | ඉටු කරන ලද ව්‍යාපෘතිය/ ව්‍යාපෘති/ වැඩසටහන | වැය ඇස්තමේන්තුව රුපියල් | 2018 ඔක්තෝබර් 30ට භෞතික ප්‍රගතිය | 2018 ඔක් 30 දිනට මූල්‍ය ප්‍රගතිය | වෙනත් සටහන් |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

ඉහත සඳහන් විස්තර හා තොරතුරු සත්‍ය බවට සහතික කරමි.

අත්සන : .................................................
විදුහල්පතිගේ නම : .................................................
දිනය : .................................................

පිටපත්: පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන කාර්යාලය